# 7.1.7 ප්‍රංශ විප්ලවය පිළිතුරු.



බහුවරණ ප්‍රශ්න සඳහා පිළිතුරු.

1.) 5 ( බුර්බෝන් රාජ වංශයට යි. )

2.) 2 ( XVI වන ලුවී රජු ය. )

3.) 1 ( තීද් නමිනි. )

4.) 3 ( මධ්‍යම පන්තිය යි. )

5.) 2 ( නැපෝලියන් බොනපාට් ය. )

1.) * ප්‍රංශ ආණ්ඩුවට මුහුණ පෑමට සිදුවූ දැඩි මූල්‍ය අර්බුදය
*අවුරුදු 175කට පසු ස්ටේට් ජෙනරල් සභාව කැඳවීම නිසා ඇතිවූ මතභේද.
* බැස්ටීල් බන්ධනාගාරයට පහර දීම.

2.) * බුර්බෝන් පෙළපතේ ලුවී රජවරුන් සතුව පැවති අසීමිත බලතල - ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ බලතල රජු වටා කේන්ද්‍රගත වී පැවතීම.
* රදළ ප්‍රභූන්ට පැවති අධික බලතල - වරප්‍රසාද සහ නිල බලය.
* අකාර්යක්ෂම පාලනය.
* ඒකීය නීති පද්ධතියක් ක්‍රියාත්මක නොවීම.
* නියෝජිත ආයතන අකර්මන්‍යව පැවතීම.

3.) <u>මධ්‍යස්ථ අවධිය</u>
* මෙය 1789 සිට 1791 දක්වා කාලයයි. මෙකල අවුරුදු 175 කට පසු ස්ටේට්ස් ජෙනරල් සභාව කැඳවන ලදි. එහෙත් අසුන් ගැනීමේදී සිදුවූ මත ගැටුම් නිසා එය සාර්ථක නොවීම.
* කවුන්ට් මිරබෝ ගේ නායකත්වය යටතේ මධ්‍යම පංතිය හා සාමාන්‍ය ජනතාව අසල තිබූ ටෙනිස් පිටියකට ගොස් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස්කර මිස නිවෙස් බලා නොයන බවට දිවුරුම් දීම ( ටෙනිස් පිටියේ දිවුරුම )
* වර්සේල්ස් මාලිගය අසල ට රැස්වී පාන් ඉල්ලූ ජනතාවට "පාන් නැත්නම් කේක් කාපල්ලා " යන මාරිඇන්ටිනෝට් බිසවගේ ප්‍රකාශය නිසා ජනතාව කෝපයට පත්වීම.
* 1789 ජුලි 14වන දා බැස්ටිල් බන්ධනාගාරයට පහර දී එහි සිටි සිරකරුවන් මුදා ගැනීම.
* මේ තුළින් ප්‍රංශ විප්ලවය ආරම්භ වී ජාතික ආණ්ඩුවක් බිහිකර ගනිමින් වැඩවසම් වරප්‍රසාද අහෝසි වී මිනස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශ එළි දැක්වීම.
* 1791 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් බිහි කිරීම හා ප්‍රංශයේ රාජාණ්ඩු ක්‍රමය අහෝසි කිරීම.

<u>රැඩිකල් අවධිය</u>
* පිරෝඩීන්වරු බලයට පත් වීම.
* 1791 ජුලි මාසයේ දී ගිලටීනය නැමති උපකරණය යොදා ගෙන xvi ලුවී රජු මරණයට පත් කිරීම
* 1792 දී ඔස්ට්‍රියාවට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කිරීම.
* 1793 දී ජැකොබින්වරු බලයට පත්වීම.
* 1795 දී නව ආණ්ඩු ක්‍රමයක් රටට හඳුන්වා දීම.
* නව ආණුඩු ක්‍රමය යටතේ සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයකට විධායක බලය පැවරීම.
* 1799 දී නැපෝලියන් බොනපාට් විසින් ප්‍රංශයේ බලය අත්පත් කර ගැනීම.

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනවිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- කේ. ඒ. ඩී. නිමල් මයා ශාන්ත ජෝසප් බාලිකා මහ වි. කොළඹ 14

Copyright © www.e-thaksalawa.moe.gov.lk

4.) * යුරෝපයේ රාජාණ්ඩු ක්‍රමය බිඳ වැටීම.
* වැඩවසම් ආර්ථික ක්‍රමය බිඳ වැටීම.
* මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට ඇතුළත් කිරීම.
* ගොවි ජනයාගේ පීඩිත භාවය අවසන් වීම හා බදු බරින් නිදහස් වීම මෙන් ම මධ්‍යම පංතිය තමන් අපේක්ෂා කළ අයිතිවාසිකම් දිනා ගැනීම.
* සාමාන්‍ය සොල්දාදුවෙකු ලෙස ප්‍රංශ යුද්ධ හමුදාවට බැඳුණු නැපෝලියන් පසුව ප්‍රංශයේ පාලකයා බවට පත්වීම සහ ඔහුගේ බුද්ධිමත් බව හා දක්ෂතා මත ප්‍රංශය බලවත් රාජ්‍යක් බවට පත් වීම.
* ප්‍රංශයේ ව්‍යාප්ත වූ ජාතිකවාදී හා ලිබරල්වාදී අදහස් යුරෝපය තුළ පැතිරීම නිසා ඉතාලිය එක්සත් වීමේ ව්‍යාපාරයට සහ 1871 දී ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයට පදනම වීම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනවිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- කේ. ඒ. ඩී. නිමල් මයා ශාන්ත ජෝසප් බාලිකා මහ වි. කොළඹ 14
Copyright © www.e-thaksalawa.moe.gov.lk